# ජගන් මා

මා නාට්‍යයක් හෝ නවකතාවක් හෝ කෙටිකතා පොතක් හෝ අවුරුදු ගණනාවකින් විවේචනය කර නැත. පසුගිය වසර කිහිපයක නිර්මාණය වූ චිත්‍රපටි දෙක තුනක් නම් මා අතින් නිර්දය විවේචනයට භාජනය වුයේ ඒ තනිකර ම බටහිර රටවල මුදලින් වැජඹෙන ව්‍යාජ ප්‍රබුද්ධයන්ගේ මනදොළ සපුරාලන සිංහල බෞද්ධ විරෝධී චිත්‍රපට වූ බැවිනි. මේ ඇතැම් චිත්‍රපටියක් පිළිබඳ තම මත මා සමග කැලණිය විශ්වවිද්‍යාලයේ එකම වේදිකාවේ පැවසීමට අසභාය චිත්‍රපට අධ්‍යක්ෂකවරු විචාරකයෝ ද්විභාෂික උගත්තු නමින් හැඳින්වෙන්නෝ පසුබට වූහ. කේ බී හේරත් මහතා එදා කෙසේ වෙතත් අද ප්‍රබුද්ධයකු විය නො හැකි ය. ප්‍රබුද්ධයෝ ජගන් මා, බිම්බා වැනි නාට්‍ය නිෂ්පාදනය නො කරති. ඔවුහු සිංහල බෞද්ධ විරෝධී කෘති “නිර්මාණය” කරති. ඔවුන් කරන නිර්මාණයක් නැත. ඔවුහු අනුකරණය කරති. ප්‍රබුද්ධයනට බටහිර යුදෙව් ක්‍රිස්තියානි සම්ප්‍රදායෙන් සුළුවෙන් හෝ ඉවතට යන කෘතියක් නයාට අඳුකොළ මෙනි. බිම්බා නාට්‍යයට ඔවුන් පහර ගැසුවේ ඒ ඔස්සේ කේ. බී . හේරත් මහතා බෞද්ධ සම්ප්‍රදායක් සෙවීමට උත්සාහ කළ බැවිනි. ඔවුන්ට අනුව බිම්බා නාට්‍යයක් නො වී ය.

ඕනෑම කලා කෘතියකින් පණිවුඩයක් ලැබෙයි. හැකි නම් පණිවුඩයක් නැති කලා කෘතියකට උදාහරණයක් සපයන මෙන් ප්‍රබුද්ධයනට අභියෝග කරමි. අඩුම තරමින් බටහිර සංස්කෘතිය ඊනියා යථාර්ථය වේය යන පණිවුඩය හෝ කලා කෘතිවලින් ලැබෙයි. මට හැඟෙන අයුරින් ජගන් මා නාට්‍යයෙන් ඉතා වැදගත් පණිවුඩයක් ලැබෙයි. ඒ බටහිර පිරිමින්ට කෙතරම් අවශ්‍ය වුවත් තමන්ට අභිමත ආකාරයට මැදිහත් වී ලෝකය (විශ්ව මාතාව) වෙනස් කිරීමට නොහැකි බවත් තමන් මැදිහත් ව ලෝකය අභිමත ආකාරයට වෙනස් කිරීමට දරණ උත්සාහය ලෝකය ම විනාශ කරමින් කෙළවර වනු ඇති බවත් ය. එහෙත් මට ප්‍රශ්නයක් වෙයි. මට ලැබෙන ඒ පණිවුඩය අනෙක් කී දෙනෙකුට ලැබෙන්නේ ද යන්න ය. සමහරවිට ඉහත සඳහන් වන්නේ මගේ විවරණය විය හැකි ය. නාට්‍යයක් පමණක් නොව ගණිත සංකල්පයක් වුව ද ඇතැම් විට එක් එක් අයට වැටහෙන්නේ එක් එක් අයුරින් ය. ඇතැම් විට එක් සංස්කෘතියක් විසින් වෙනත් සංස්කෘතියක නිර්මාණය කරන ලද සංකල්පයක් අවශෝෂණය කරගනු ලබන්නේ ද එක ම අයුරින් නො වේ. මාධ්‍යමිකවාදීන්ගේ මූලිකත්වයෙන් නිර්මාණය කරන ලද ගණිත සංකල්පයක් වූ ශුන්‍යය (බිංදුව) යන්න බටහිරයන් අවශෝෂණය කරගත්තේ වෙනත් ආකාරයකට ය. බෞද්ධයන්ගේ ශූන්‍යය ගතික සංකල්පයක් විය. බටහිරයන්ගේ ශූන්‍යය යන්න අවකලනයේ දී (ඩිෆරන්ෂේශන්) ප්‍රශ්න ඇතිකරන ස්ථිතික මියගිය දරදඬු සංකල්පයකි. (වැඩි විස්තර සඳහා විදුසර ලිපි පෙළ කියවන්න). ඊනියා කියවීම (රීඩින්) නමැති දුර්වල සංකල්පය ගැන බටහිරයන් කතාකිරීමට සියවස් කිහිපයකට පෙර ලියන ලද ලෝවැඩ සඟරාවේ තම තම නැණ පමණින් දැන ගැනීමක් ගැන කියැවෙයි. අසන්නා ද, කියවන්නා ද, නරඹන්නා ද තම තමන්ට සාපේක්ෂව නිර්මාණ කරන බැවින් ඒ එසේ වෙයි. සාපේක්ෂකත්වය තිබිය දී ඊනියා කියවීම නම් නොගැඹුරු සංකල්පය අවශ්‍ය නැත. එහි ඇති අරුමයක් නැත.

ජගන් මා නාට්‍යයේ කතා වස්තුව තරමක් සංකීර්ණ වෙයි. එක්නැලිගොඩ දිසාව ඉංගිරිසි ආණ්ඩුව යටතේ නිලයක් දරණ ප්‍රභූවරයෙකි. උඩුරාවණ දිසාව ඔහුගේ මිතුරෙකි. එක්නැලිගොඩ දිසාවගේ ආර්යාවට දරුවකු ලැබීමට ආසන්න අවස්ථාවේ දී උඩුරාවණ දිසාව පැමිණෙයි. ඒ හමුවේ දී එක්නැලිගොඩ දිසාව තම අපේක්ෂා මිතුරාට කියයි. තම පරම්පරාවේ එකොළොස් වතාවක් කුළුඳුලෙන් උපත ලබා ඇත්තේ පිරිමි දරුවන් බවත් තමන්ට ද පුතකු ලැබෙනු ඇති බවත් ඒ බව ආණ්ඩුකාරයාට ද පවසා ඇති බවත් එක්නැලිගොඩ දිසාව කියයි. එසේ ම පුතාට සටන් ශිල්පය උගන්වන බවත් ඉංගිරිසි ආණ්ඩුවේ උසස් තනතුරකට පුතා පත්කිරීමට කටයුතු කරන බවත් ඔහු පවසයි. ඔහු පවසන තවත් වැදගත් කරුණක් වෙයි. එනම් දුවකට ඉංගිරිසින් වැදගත් තනතුරක් නො දෙන බව ය. එපමණක් නොව පුතා ඉංගිරිසි පන්නයට හදාවඩා ගැනීම සඳහා ඉංගිරිසින් ළඟ සේවය කළ සිංහල ස්ත්‍රියකගේ සේවය ලබාගන්නා බවත් ඔහු කියයි. වෙරෝනිකා නම් මේ ස්ත්‍රිය ආගමින් කතෝලික හෝ ක්‍රිස්තියානි හෝ වෙයි.

පුතකු පිළිබඳ මහත් බලාපොරොත්තු තබාගෙන සිටිය ද එක්නැලිගොඩ ආර්යාව ප්‍රසූත කරන්නේ දියණියක ය. දිසාව ඉන්පසු ඒ දියණිය චර්යාවෙන් හා සිතුවිලිවලින් පුතකු කිරීමට උත්සාහ කරයි. එහි දී ඔහු දියණියක බිහිකිරීමේ වරදට ආර්යාව ද පිටමං කරයි. වෙරෝනිකා දියණිය පිරිමි දරුවකු ලෙස රැකබලාගනියි. දියණිය පුතෙක් වෙයි. නමින් හඳු වෙයි. හඳු සටන් ක්‍රම පුහුණු කරයි. මේ අතර දිනක් උඩුරාවණ දිසාවගේ පුත් අයිරාවණ සටන්ක්‍රම ඉගෙන

© Prof. Nalin De Silva

කේරළයෙන් පැමිණෙයි. හඳූ මිතුරු සටනකින් අයිරාවණ පරදවයි. එහෙත් හඳූට අයිරාවණ පිළිබඳ සිතක් පහළවෙයි. හඳූ ඒ බව අයිරාවණට හෙළි කරයි. හඳූ පිරිමියකු යැයි සිතන අයිරාවණ හඳූගෙන් පළා යයි. එහෙත් හඳූට තමා ගැන ම ප්‍රශ්න ඇතිවෙයි. වෙරෝනිකා මේ අතර එක්නැලිගොඩ ආර්යාව වෙනත් පුරුෂයකු සමග විවාහ වී පිරිමි දරුවකු ද ප්‍රසූතකර ඒ අසලම ජීවත්වන බව දැනගනියි. එක්නැලිගොඩ දිසාව නොමැති අවස්ථාවක ආර්යාව පැමිණෙයි. ආර්යාව හා හඳූ මුණගැසීමේ ප්‍රතිඵලයක් ලෙස අවසානයේ දී හඳූ තමන් යුවතියක බව දැනගනියි. හඳූ ඉන්පසු හඳා වෙයි. එක්නැලිගොඩ දිසාව තමන්ට වැරදුණු බව තේරුම්ගෙන හඳා තම නැගණියකගේ දියණියක ලෙස ලොවට හඳුන්වා දෙයි. හඳූ සටන්ක්‍රම ඉගෙනීමට කේරළයට ගිය බව පවසයි. යම්කිසි හේතුවක් නිසා අයිරාවණ නැවතත් එක්නැලිගොඩ නිවසට පැමිණෙයි. එහි දී ඔහු හඳා සමග පෙමින් බැඳී ගාන්ධර්ව විවාහයකට එළඹීමට දෙවියන් ඉදිරියේ සපථ කරයි. දේවාලයෙන් ආපසු පැමිණි අයිරාවණට හඳා සියල්ල හෙළි කරයි. අයිරාවණ කළකිරී ආපසු යයි. හඳා ගැහැණියක හා පිරිමියකු අතර මාරු වී හා නොවී මරණයට පත්වෙයි.

මෙහි නාට්‍යමය අවස්ථා මෙන් ම අභව්‍ය සිද්ධීන් ද වෙයි. මේ තීරුවෙන් ඒ සියල්ල ගෙනහැර දැක්විය නො හැකි ය. හඳූ හඳා ගැටුම, එක් පුද්ගලයකු අභ්‍යන්තරව පරස්පරයකට මුහුණ දීම, පිරිමියා හා ගැහැණිය අතර මාරු වීම හා නොවී ම මැනවින් නිරූපණය වී ඇතැයි සිතමි. වෙරෝනිකා මුහුණ පාන ගැටළු ද එලෙස ම නිරූපණය වෙයි. ඒ ඒ අවස්ථාවන්හි රඟපෑම් ද ප්‍රශංසනීය වෙයි. එහෙත් එක්නැලිගොඩ දිසාව හා උඩුරාවණ දිසාව “ පුතුන්ට” පෙරදිග සටන් ක්‍රම උගන්වන්නේ ඇයි? ඒ දැනගැනීමෙන් ඉංගිරිසින් යටතේ ඉහළ නිලයකට යෑමට අවස්ථාවක් නො ලැබේ. සටන්ක්‍රම වෙනුවට රෝම ලන්දේසි නීතිය හෝ එයට පෙර කාලයක නම් කෝපි වගාව හෝ උගන්වා හඳූට අයිරාවණ පරාජය කිරීමේ අවස්ථාවක් ලබා දුනි නම් මැනවි යැයි සිතෙයි. එක්නැලිගොඩ ආර්යාව එක්නැලිගොඩ වලවුව අසල හදිසියේ වෙරෝනිකාට මුණගැසීම නාට්‍යමය අවස්ථාවකට වඩා නාට්‍ය සඳහා වූ අවස්ථාවක් යැයි කිව හැකි ය.

ඒ කෙසේ වෙතත් ඉංගිරිසින්ගේ ආභාසය ලැබ ගැහැණියට වඩා පිරිමියා වැදගත් යැයි සිතන එක්නැලිගොඩ තමා මැදිහත් වී අභිමතය පරිදි ගැහැණියක පිරිමියකු කිරීමට සැරසෙයි. එහෙත් ස්වභාව ධර්මය බටහිර පිරිමියාට කැමති ලෙස වෙනස්කළ හැකි නො වේ. අද සැත්කම් මාර්ගයෙන් ලිංග විපර්යාස සිදුකරනවා විය හැකි ය. එසේ  වුවත් එහි දී සිදුවන මානසික විපර්යාස ගැන බටහිර විද්‍යාවට ඇති අවබෝධය කුමක් ද? ඒ කුමක් වුවත් ජගන් මා නාට්‍යය ගැහැණියක පිරිමියක බවට පත්කිරීමේ කතාවක් නොව විශ්වය බටහිර පිරිමින්ගේ අභිමතය පරිදි වෙනස්කිරීම පිළිබඳ කතාවකි. බටහිර පිරිමි අවුරුදු පන්සියයක පමණ කාලයක කරන්නේ තම අභිමතය පරිදි විශ්ව මාතාව (ජගන් මා) වෙනස් කිරීමට උත්සාහ කිරීම ය. බටහිර පිරිමි එසේ කළහැකි යැයි සිතති. පැරණි ග්‍රීකයන්ගේ පෘථිවිය පිළිබඳ දෙවඟන වූ ගෙයා නමින් බටහිර විද්‍යාඥයකු වූ ලව්ලොක් මහතා ජීවය ද පොළොව ද පරිසරය ද එකතුකර එකම අනුකලිත පද්ධතියක් පිළිබඳ සංකල්පය නිර්මාණය කර ඇත. ගෙයා නම් වූ මේ සමස්ත පද්ධතිය ජීවයක් මෙන් ක්‍රියාකරමින් ඒක රේඛීය ඩාවිනීය සංකල්ප මතක් කරමින් වෙනස්කිරීම්වලට අනුගත වෙයි. බටහිර පිරිමින්ට ඔබින අන්දමට ලව්ලොක් මහතා සිතන්නේ මේ ජීවය මිනිසුන්ගේ මැදිහත්වීමෙන් කරන වෙනස්කම්වලට අනුගත වෙමින් පවතින බව ය. එහෙත් පෙරදිග අනුකාරක ඇංකරයන් නොවන්නන්ට ඒ එසේ නො වෙයි. ගෙයා දෙවඟන හෝ ජගන් මා හෝ බටහිර පිරිමින්ට අවශ්‍ය ආකාරයට වෙනස්කළ හැකි නො වේ. ජෛවීය පද්ධතියකට වෙනස්වීම්වලට ඔරොත්තු දිය හැක්කේ සීමාවන් ඇතුළත ය. විශ්වයේ (ලෝකයේ) ඇත්තේ ගතික සමතුලිතතාවකි. ඒ සමතුලිතතාව ඇත්තේ ලව්ලොක් මහතා හා බටහිර පිරිමින් සිතන අයුරින් නොව සීමාවන් ඇතුළත ය.(පරිසරය හා බටහිර ආකල්ප කියවන්න) සීමාවන්ගෙන් ඔබ්බට ගිය විට සිදුවන්නේ විනාශයකි. අද ඊනියා සංවර්ධනයක නාමයෙන් මුළු ලොවම තම අභිමතය පරිදි වෙනස්කිරීමට දඟලන බටහිර පිරිමින් අවසානයේ දී ලෝකය ම විනාශ කරනු ඇත. නාට්‍යයෙන් දීමට තැත්කරන්නේ ඒ පණිවුඩය යැයි සිතමි. එහෙත් ඒ ප්‍රේක්ෂකයාට සෘජුව දැනගන්නට ලැබෙන්නේ නම් මැනවි. කලා කෘතියක ව්‍යංගය, ධ්වනිතය ආදිය ඇතැම් තැන්වල තිබිය යුතු ය. එහෙත් සමස්තය ම ගත්කල එසේ නොවිය යුතු යැයි සිතමි. සමස්තය සංස්ලේෂණාත්මක ව ගත යුතු ය. ජාතක කතාවක සමස්තය පැහැදිළි ය. බටහිර පිරිමින්ගේ මැදිහත්වීම්වලට විරුද්ධ කලා කෘතියක් ද බටහිර පිරිමින්ගේ විශ්ලේෂණාත්මක අච්චුවේ ම නිර්මාණය කිරීමට සිදු වී ඇත. විශ්ලේෂණයෙහි හා වියුක්ත චින්තනයෙහි සාමාන්‍යයෙන් පිරිමි දක්ෂයෝ ය. සංස්ලේෂණයෙහි හා සංයුක්ත චින්තනයෙහි ගැහැණු දක්ෂයෝ ය. බටහිර අධ්‍යාපනයෙන් පිරිමියකු වූ නොවූ ගැහැණියක නාට්‍යය දකින්නේ කෙසේ ද?

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva